සියළුම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

ඌව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ஊவா மாகாண கல்வித் திணைக்களம்
UVA PROVINCIAL DEPARTMENT OF EDUCATION

GIT	01	I

සාමාන්‍ය තොරතුරු තාක්ෂණය ආදර්ශ ප්‍රශ්න පත්‍රය - 2013
Genaral Information Technology Model Paper - 2013

සාමාන්‍ය තොරතුරු තාක්ෂණය I
Genaral Information Technology I

පැය එකයි
One hour

වැදගත්

i. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න
ii. අංක **1** සිට **40** තෙක් ප්‍රශ්නවල, දී ඇති (1), (2), (3), (4) පිළිතුරුවලින් **නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ** පිළිතුර තෝරන්න.
iii. ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන්, ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (X) ලකුණ යොදන්න.

---

1. දෙවන හා තෙවන පරම්පරා පරිගණක වල භාවිතා කරන ලද තාක්ෂණයන් වන්නේ පිළිවෙලින්,
   1. රික්තක නළ හා ට්‍රාන්සිස්ටර වේ
   2. ට්‍රාන්සිස්ටර හා රික්තක නළ වේ
   3. ට්‍රාන්සිස්ටර හා අනුකලිත පරිපථ වේ
   4. රික්තක නළ හා අනුකලිත පරිපථ වේ

2. 79 යන දශම සංඛ්‍යාවට තුල්‍ය ද්විමය සංඛ්‍යාව වන්නේ
   1. 1001111 2. 1111000 3. 1100011 4. 1000001

3. A හා B ලෙස පාරවල් 2ක් ඇති අතර A පාරේ දිග මීටර 111010_2 ද B පාරේ දිග A පාරට වඩා මීටර 32ක් අඩු ද නම් A හා B පාරවල් දෙකේ මුලු දිග වන්නේ,
   1. 11010_2 2. 10010100_2 3. 1010100_2 4. 1010100_2

4. සංයුක්ත තැටියක (Compact Disk) ධාරිතාවට තුල්‍ය වන්නේ කුමක්ද?
   1. 111000000_2 2. 1274_8 3. 127_8 4. 1110000100_2

5. 1000001_2 මගින් ASCII හි A නිරූපනය කරයි නම්, 1000100_2 මගින් නිරූපනය වන්නේ පහත සඳහන් දෑ අතරින් කවරක් ද?
   1. D 2. F 3. E 4. G

6. A+A.B යන තාර්කික ප්‍රකාශනය තුල්‍ය වන්නේ
   1. A 2. B 3. A+B 4. A+B

7. සන්දර්ශකය(monitor) හා සුපරීක්ෂකය (scanner) සම්බන්ධ කිරීමට භාවිතා කරන කෙවෙනි පිළිවෙලින්,
   1. serial, parallel
   2. vga, parallel
   3. parallel, vga
   4. usb, parallel

8. ඌවතිස්ස මහා විද්‍යාලයේ තොරතුරු තාක්ෂණ සංගමයේ ලේකම් විසින් මැයි මස 25 වන දින පාසල් පරිගණක ඒකකයේ දී සකසන ලද තොරතුරු තාක්ෂණ දින වැඩසටහන් විස්තරය, නැවත විවෘත කර ගැනීමට එහි සභාපතිට අවශ්‍ය විය. එවිට එය,
   1. දෘඩ තැටියේ සිට ප්‍රධාන මතකය හරහා සන්දර්ශකයෙන්(monitor) දැකගත හැක
   2. ප්‍රධාන මතකයේ සිට දෘඩ තැටිය හරහා සන්දර්ශකයෙන් දැකගත හැක
   3. දෘඩ තැටියේ සිට සන්දර්ශකයෙන් දැකගත හැක
   4. ප්‍රධාන මතකයේ සිට සන්දර්ශකයෙන් දැකගත හැක

9. 12 ශ්‍රේණිය ICT පොතේ පිටකවරය, ඇගයීමක පිටකවරයක් සඳහා ඇතුළත් කිරීමට ශිෂ්‍යාවක් අදහස් කර ඇත. එය සිදු කර ගතහැකි ක්‍රම 2 ක් ලෙස පහත ක්‍රම යෙහෙලියක විසින් පවසා ඇත.

A. සුපරීක්ෂකයක් (scanner) භාවිතා කර පරිගණකයට ඇතුළත් කිරීම

B. පිටකවරයේ මුද්‍රිත පිටපතක් ලබා ගැනීම

ඉහත කාර්යය ඉටුකර ගැනීම සඳහා සත්‍ය ලෙසම භාවිතා කළ යුත්තේ,

1. A පමණි 2. B පමණි 3. A ට පසු B වේ 4. B ට පසු A වේ

10. මතක උපාංග සම්බන්ධ පහත වගන්ති අතරින් සත්‍ය වන්නේ කුමක්ද?

1. සසම්භාවී ප්‍රවේශ මතකයේ(RAM) දත්ත ප්‍රවේශ වේගයට වඩා වාරක මතකයේ (cache memory) දත්ත ප්‍රවේශ වේගය අඩුය
2. රෙජිස්ටර මතකයේ දත්ත ප්‍රවේශ කාලයට වඩා අඩු කාලයකින් චුම්භක පටියකට (magnetic tape) ප්‍රවේශ විය හැක
3. සසම්භාවී ප්‍රවේශ මතකයේ ධාරිතාව චුම්භක පටියක ධාරිතාවට වඩා වැඩියි
4. රෙජිස්ටර මතකයේ ධාරිතාවට වඩා වාරක මතකයේ ධාරිතාව (cache memory) වැඩිය

11. පහත ඒවා අතුරින් වාෂ්පශීලී මතක මොනවා ද?

1. නම්‍ය තැටි ධාවකය හා සසම්භාවී ප්‍රවේශ මතකය
2. රෙජිස්ටර මතකය හා සසම්භාවී ප්‍රවේශ මතකය
3. පඨන මාත්‍ර මතකය හා සසම්භාවී ප්‍රවේශ මතකය
4. කෑෂ් මතකය හා පඨන මාත්‍ර මතකය

12. ද්විපථ (duplex) සන්නිවේදනය සඳහා උදාහරණයක් ලෙස සැලකිය හැක්කේ කුමක්ද?

1. රූපවාහිනී වැඩසටහනක් පිළිබඳ පුද්ගල සාකච්ඡාවක් වේ
2. තනි ධාවන පථයක් සහිත උමං මාර්ගයක දුම්රිය 2ක් ධාවනය වන අවස්ථාවක් වේ
3. රූපවාහිනී සම්ප්‍රේෂණාගාරයකින් වැඩසටහන් සම්ප්‍රේෂණය කිරීම
4. වෝකි ටෝකි මගින් හදිසි ඇමතුම් සන්නිවේදනය



13. මෙම පරිගණක ජාලයේ ස්ථල විද්‍යාව(topology) කුමක්ද?

1. star 2. bus
3. ring 4. tree

14. රැහැන් රහිත මූසික, යතුරුපුවරු සඳහා භාවිතා කළහැකි සන්නිවේදන මාධ්‍යයක් වන්නේ,

1. Microwave 2. Satellite
3. fiber optic cable 4. Infrared

ප්‍රශ්න අංක 15 හා 16 පහත දැක්වෙන්නේ විද්‍යුත් පරිපථයක රූප සටහන හා සම්බන්ධ වේ.



15. එහි සැකසීමට අනුරූප වන තාර්කික ශ්‍රිතය කුමක්ද?

1. *LAMP* =AND LIGHT SENSOR (NOT PRESSURE SENSOR) AND SWITCH
2. *LAMP* =NOT LIGHT SENSOR AND (PRESSURE SENSOR AND SWITCH)
3. *LAMP* =(LIGHT SENSOR AND (PRESSURE SENSOR AND SWITCH)
4. *LAMP* =(NOT LIGHT SENSOR AND PRESSURE SENSOR) AND SWITCH

16. *LAMP* හි අගය 1 නම් LIGHT SENSOR, PRESSURE SENSOR, SWITCH සඳහා අනුපිළිවෙලින් ගතහැකි අගයයන් වන්නේ කුමක් ද?
    1. 1, 1, 1 2. 1,0,0 3. 0,1,1 4. 0, 1,0

17. මෙහෙයුම් පද්ධති සම්බන්ධ පහත ප්‍රකාශ සලකන්න.
    A) කේතනය (coding) පිළිබඳ අවබෝධයක් නොමැතිව කිසිදු මෙහෙයුම් පද්ධතියක් භාවිතා කළ නොහැක
    B) MS DOS හා Ubuntu යනු විධාන රේඛා අතුරු මුහුණත් සහිත මෙහෙයුම් පද්ධති වේ
    C) උපාංගවල ක්‍රියාකාරී ශිඝ්‍රතාව කළමනාකරණය මෙහෙයුම් පද්ධති මගින් ඉටු කරයි

    ඉහත වගන්ති අතරින් නිවැරදි වන්නේ කුමක් ද?
    1. A, B පමණි 2. A, C පමණි 3. B, C පමණි 4. A, B, C යන සියල්ලම

18. පැතුරුම්පතක A9 කෝෂයේ =(A4/A7)+A5 ලෙස ඇතුළත් කර ඇත. A4, A5 හා A7 කෝෂයන්හි පිළිවෙලින් 10, 5 හා 4 ඇතුළත් කළවිට ලැබෙන අගය කුමක් ද?
    1. 7 2. 7.5 3. 6 4. 10

19. පැතුරුම්පතක A1 හා A3 කෝෂ වලට පහත සමීකරණ ඇතුළත් කර ඇත. එහි A3 කෝෂය සඳහා ලැබෙන පිළිතුර කුමක් ද?



    1. 3
    2. 3.7
    3. 3.66
    4. 3.6

20. වදන් සැකසුම් මෘදුකාංග සම්බන්ධව පහත වගන්ති අතරින් සාවද්‍ය වන්නේ කුමක් ද?
    1. වෙබ් පිටු වල මෙන් hyperlink යෙදිය නොහැක
    2. බොහෝ පිරිසකට යැවීම සඳහා එකවර ලිපි සැකසීමේ හැකියාව ඇත
    3. ගොනු සංස්කරණය පහසුවෙන් සිදුකළ හැක
    4. ලිපියක අක්ෂර වින්‍යාස හා ව්‍යාකරණ සැකසීමේ හැකියාව ඇත

21. වදන් සැකසුම් මෘදුකාංගයක ගොනුවක් විවෘත කිරීම සඳහා .... භාවිතා කළ නොහැක.
    1. Ctrl + O 2. Shift + O
    3. File→Open 4. ඉහත සියල්ලම

22. ෆෝල්ඩර (Folder) සම්බන්ධයෙන් වැරදි ප්‍රකාශය වන්නේ
    1. තැනීම හා මැකීම කළ හැකිය
    2. වෙනත් ස්ථානයකට ගෙන යාමට හැකිය
    3. ධාරිතාවය (capacity) හා වර්ගය(type) දැක ගත හැකිය
    4. ධාරිතාවය (capacity) නිශ්චිත අගයකට වෙනස් කර ගැනීමට හැකිය

23. විද්‍යුත් ඉදිරිපත් කිරීමක් සිදු කරන අතරතුරදී පරිගණකයේ තිරය තාවකාලිකව කලු පැහැ ගැන්වීම සඳහා කළ යුතු වන්නේ
    1. “N” යතුර එක් වරක් එබීමය 2. “B” යතුර එක් වරක් එබීමය
    3. “W” යතුර එක් වරක් එබීමය 4. “P” යතුර එක් වරක් එබීමය

24. එක්තරා මෙහෙයුම් පද්ධතියක් නොමිලේ බාගත (download)කළ හැකිය. එය භාවිතා කිරීම සඳහා බලපත් අවශ්‍ය නොවේ. ප්‍රභව කේතය(source code) විවෘතය. මෙම මෙහෙයුම් පද්ධතිය විය හැක්කේ
    1. ඩොස් (Dos) ය 2. උබුන්ටු (Ubuntu) ය
    3. වින්ඩොස් XP ය (Windows XP) 4. මැක් ඕඑස් (Mac OS)ය

25. සම්බන්ධක දත්ත පාදක(relational database) වගුවක "පාරිභෝගික චෝදනා" ක්ෂේත්‍රය ඇතුළත් කිරීම සඳහා සුදුසු දත්ත වර්ගය කුමක් ද?
    1. Text 2. Memo 3. String 4. Integer

26. දත්ත පාදක කළමනාකරණ පද්ධතියක......................
   1. table මගින් සුවිශේෂී සම්බන්ධතා ඇති දත්ත ඇතුළත් කිරීම පමණක් සිදු කරයි
   2. report මගින් දත්ත පාදකයේ ඇති දත්ත මුද්‍රණය කිරීම පහසු කරයි
   3. queries දත්ත පාදකයේ ඇති දත්ත සියල්ල වෙනස් කිරීම සඳහා පමණක් භාවිතා කරයි
   4. forms මගින් දත්ත පාදකයට දත්ත ඇතුළත් කිරීම පමණක් සිදු කරයි

27. දත්ත පාදක වගුවක ප්‍රාථමික යතුර ලෙස භාවිතා කළ නොහැක්කේ,
   1. විද්‍යුත් තැපැල් ලිපිනයක් වේ
   2. ජාතික හැඳුනුම්පත් අංකය
   3. උපන් දිනය
   4. ශිෂ්‍ය ලියාපදිංචි අංකය



28. මෙම ගැලීම් සටහනෙහි තාර්කික ව්‍යුහය(logical structure) මගින් පෙන්නුම් කරනුයේ
   1. අනුක්‍රමයකි (Sequence)
   2. සරල තේරීමකි (Selection)
   3. අනුක්‍රමයක් මෙන්ම සරල තේරීමකි
   4. අනුක්‍රමයක් මෙන්ම පුනර්කරණයකි(Repetition)

29. මෙම ගැලීම් සටහනෙහි N=3 නම් ප්‍රතිදානය කුමක් ද?
   1. 6   2. 3
   3. 24   4. 5

30. n යනු නිඛිලමය විචල්‍යයක් නම් පහත සඳහන් ක්‍රමලේඛ කේතය,

```
n=6
m=2
Do while n>4
    n= n-1
Loop
```

   1. වාර 3ක් ක්‍රියාත්මක වේ   2. කිසිවිටක අවසන් නොවේ
   3. වාර 2ක් ක්‍රියාත්මක වේ   4. එක් වරක් ක්‍රියාත්මක වේ

31. 50\ 6 හි අගය කීයද?
   1. 3   2. 8.3   3. 8.33   4. 8

32. පළමු හා දෙවන පරම්පරාවේ පරිගණක භාෂා 2ක් වන්නේ,
   1. යන්ත්‍ර භාෂාව හා පහල මට්ටමේ පරිගණක භාෂාව
   2. පහල මට්ටමේ පරිගණක භාෂාව හා යන්ත්‍ර භාෂාව
   3. යන්ත්‍ර භාෂාව හා අසෙම්බ්ලි භාෂාව
   4. අසෙම්බ්ලි භාෂාව හා යන්ත්‍ර භාෂාව

33. පරිගණක වැඩසටහනක තාර්කික වැරදි (logical errors)හා කාරක රීති (syntax errors)දෝෂ සම්බන්ධ පහත වගන්ති සලකන්න
   A. වැඩසටහනක් ලිවීමේ දී විචල්‍යයන් සඳහා මූලපද(keyword) භාවිතා කිරීම තාර්කික වැරදි ගණයට අයත් වේ
   B. බලාපොරොත්තු නොවන ප්‍රතිඵල පැමිණීම නිසා සිදුවන දෝෂ කාරක රීති දෝෂ ගණයට අයත් වේ
   C. තාර්කික වැරදි ඇති වැඩසටහනක් වස්තු කේතය බවට පරිවර්තනය කරගත හැකි වුවද කාරක රීති දෝෂ ඇති වැඩසටහනක් වස්තු කේතය බවට පරිවර්තනය කරගත නොහැක

ඉහත වගන්ති අතරින් නිවැරදි වන්නේ,
   1. A පමණි   2. A හා B පමණි   3. C පමණි   4. A හා C පමණි

34. විචල්‍යයක් (variable)සම්බන්ධයෙන් සාවද්‍ය වන්නේ පහත දැක්වෙන කවර ප්‍රකාශය ද?
    1. විචල්‍යයකට නමක් තිබිය යුතුමය
    2. විචල්‍යයකට දත්ත වර්ගයක් තිබිය යුතුමය
    3. විචල්‍යය සඳහා දෙන අගය මතකයේ ස්ථිරවම ගබඩා වී තිබෙන්නේ නැත
    4. විචල්‍යය නාමයන් සඳහා මූල පද වුවද භාවිතා කළ හැක

35. පැස්කල් භාෂාවේ වලංගු නොවන මෙහෙයවනය (operator) මින් කුමක්ද?
    1. :=　　2. =>　　3. < >　　4. < =

36. පහත සඳහන් දෑ අතරින් පැස්කල්හි වලංගු ප්‍රරූප(type identifier) හඳුන්වනයක් නොවන්නේ
    1. integer　　2. real　　3. char　　4. float

37. Integer වර්ගයේ අවයව 10 කින් සමන්විත NUMBERS යන අරාව (array)අර්ථ දක්වනු ලබන නිවැරදි ප්‍රරූප අර්ථ දැක්වීම (type definition) තෝරන්න
    1. Type NUMBERS=array(1..10) of int ;
    2. Type NUMBERS := array(1..10) of integer;
    3. Type NUMBERS = array[1..10] of integer;
    4. Type NUMBERS := array[1..10] of int;

38. ඉහල මට්ටමේ කළමණාකරුවන්ට හා විධායකයින්ට ක්‍රමෝපායික තීරණ ගැනීමේ ක්‍රියාවලියට ආධාර කිරීම සඳහා සාදන ලද පද්ධතියක් වන්නේ,
    1. විශේෂඥ තොරතුරු පද්ධතිය
    2. විධායක තොරතුරු පද්ධතිය
    3. තීරණ ආධාරක පද්ධතිය
    4. කළමනාකරණ තොරතුරු පද්ධතිය

39. කාණ්ඩ සැකසුම් පද්ධතියක් සඳහා උදාහරණයක් වන්නේ,
    1. මෘදුකාංග ඉංජිනේරු රැකියාවක් සඳහා අයදුම් පත්‍ර පරීක්ෂා කර කැඳවීම් ලිපි සැකසීම
    2. ජපානයේ භූ චලන පැමිණි විට ඒ පිළිබඳ මහජනතාව දැනුවත් කිරීම
    3. ක්‍රීඩා පිටියේ දැල් පන්දු ක්‍රීඩා කරන විට ලකුණු සටහන් කිරීම
    4. ඉහත කිසිවක් නොවේ

40. අන්තර්ජාලය අනිසි ලෙස භාවිතා කිරීම අවම කිරීමට වඩාත් ප්‍රායෝගික විසඳුම වන්නේ
    1. අන්තර්ජාලය අනිසි ලෙස භාවිතා කරන අය සඳහා නීතිරීති පද්ධතියක් සකස් කිරීමය
    2. අනවශ්‍ය වෙබ් අඩවි තෝරා පෙරීමකට භාජනය කිරීමය
    3. අන්තර්ජාලය භාවිතා කිරීම සීමා කිරීමය
    4. අන්තර්ජාලය ඵලදායී ලෙස යොදා ගැනීම පිළිබඳව ජනතාව දැනුවත් කිරීමය

❋❋❋